උසස් අධ්‍යාපනය පුළුල් කිරීම සහ සංවර්ධනය කිරීම වේගවත් කිරීමේ ව්‍යාපෘතියේ (ව්‍යාපෘති සංරචකය) 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ප්‍රතිසංස්කරණය සහ සංවර්ධනය උදෙසා වන ජාත්‍යන්තර බැංකුව සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර 2017 ජුලි 17 දින එළඹි අංක 8743 එල්කේ දරන ණය ගිවිසුමේ හා අංක 6026 එල්කේ දරන මූල්‍ය ගිවිසුමේ 4.09(ආ) ව්‍යවස්ථා සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියේ ණය හා මූල්‍ය ගිවිසුම්වලට අනුව, එවකට උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය වර්තමානයේ අධ්‍යාපන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර රජයේ විශ්වවිද්‍යාල සහ ශ්‍රී ලංකා උසස් තාක්ෂණික අධ්‍යාපන ආයතන, උසස් තාක්ෂණික ආයතන සහ අමාත්‍යාංශය සහ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. විද්‍යාව, තාක්ෂණය, ඉංජිනේරු සහ වෛද්‍ය අංශවල ප්‍රමුඛ විෂයයන්ට රජයේ විශ්ව විද්‍යාලවලට, ශ්‍රී ලංකා උසස් තාක්ෂණික අධ්‍යාපන ආයතන, උසස් තාක්ෂණික ආයතන සහ රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතනවලට ඇතුළත්වීම වැඩිකිරීම, උපාධි වැඩසටහන්වල ගුණාත්මක බව වැඩිදියුණු කිරීම හා උසස් අධ්‍යාපන අංශයේ පර්යේෂණ හා නව සොයා ගැනීම් දිරිමත් කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ණය සහ මූල්‍ය ගිවිසුම්වලට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 18,136කට සමාන එජඩො මිලියන 100 මූල්‍යනය කිරීමට ජාත්‍යන්තර සංවර්ධන සංගමය එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2018 මාර්තු 01 දින ආරම්භ කරන ලද අතර 2023 ජුනි 30 වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි.

## 1.3 තත්ත්වාගණනය කළ මතය

මාගේ වාර්තාවේ 2 වගුවෙන් විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර,ව්‍යාපෘතියේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා කාර්යසාධන ප්‍රකාශනය හා එහි මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ල.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදි. මෙම විගණන ප්‍රමිත යටතේ වූ මාගේ වගකීම,මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත.මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

**1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුලත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා හා වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.
මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැක මුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි., තවද

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට,ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ.ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛණ සැකසීම,චේතනාන්විත මඟ හැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත් අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිත කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කල අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් බව අගයන ලදි.

මාගේ විගණනය තුලදී හඳුනාගත් වැදගත් විගණන සොයා ගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.1 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

| | ගිණුම්කරණ අඩුපාඩු | මුදල | කළමනාකරණයේ අදහස් දැක්වීම් | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| | | රු.මිලියන | | |
| (අ) | එකතුව රු. මිලියන 15.65ක් පමණක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතනවල ලබාදුන් අග්‍රිම ලෙස අනාවරණය කර තිබුණි. කෙසේවෙතත්, රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන | 15.65 | වෙනස සඳහා හේතුව 2021 වර්ෂයේදී උසස් අධ්‍යාපනය පුළුල් කිරීම සහ සංවර්ධනය කිරීම වේගවත් කිරීමේ ව්‍යාපෘතිය (AHEAD) | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට පෙර රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන සමඟ වියදම් සනාථ කර ගැනීම අවශ්‍ය වේ. |

| | | | | |
|---|---|---|---|---|
| | හය මගින් දරන ලද වියදම පැහැදිලිව අනාවරණය කිරීමකින් තොරව අග්‍රිමවලින් කරන ලද වියදම මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපත්ති විශ්ලේෂණ, අධ්‍යාපන, නියාමනය සහ ඇගයීම තුළ ඇතුළත් කර තිබුණි. | | සඳහා ප්‍රමාණවත් නොවන අයවැය ප්‍රතිපාදන අනුමත කිරීම වේ. | |
| (ආ) | රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන හය විසින් 2019 සිට 2021 දක්වා දරන ලද මුළු වියදම එම ආයතනවල තහවුරු කිරීම් අනුව අඩුවෙන් දක්වා තිබුණි. | 12.45 | -එම- | -එම- |
| (ඇ) | රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන 6හි ශේෂ තහවුරු කිරීම් අනුව මූල්‍ය ප්‍රකාශනවල රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන වෙත කරන ලද අග්‍රිම ශේෂය වැඩියෙන් දක්වා තිබුණි. | 12.5 | -එම- | -එම- |

**2.2 නිරවුල් නොකරන ලද ශේෂ**

| | විස්තරය | මුදල<br>රු.මිලියන | නිරවුල් නොකරන කාලපරිච්ඡේදය | කළමනාකරණයේ අදහස් දැක්වීම් | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|---|
| (අ) | නිසි අවශ්‍යතා විශ්ලේෂණයක් කිරීමකින් තොරව ව්‍යාපෘතිය විසින් අත්තිකාරම් ලබාදී තිබුණි. එමනිසා රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතනවල සැකියයුතු මුදලක් උපයෝජනය නොකර පැවතුණි. | 22.3 | මාස 1 ½ සිට 6 දක්වා | අත්තිකාරම් ලේඛණයේ ශේෂය නිරවුල් නොකරන ලද මුදල් ශේෂය ලෙස පෙන්වනු ලැබේ. නමුත් යථාර්තය නම් මෙම අරමුදල් ආයතනය විසින් භාවිත කර ඇති අතර එවැනි උපයෝජනය නොකල මුදල් ශේෂය නොමැත. | අත්තිකාරම් ලබා දීමට පෙර නිසි අවශ්‍යතා විශ්ලේෂණයක් සිදු කිරීම අවශ්‍ය වේ. |
| (ආ) | නිසි අවශ්‍යතාවයන් සැලකීමකින් තොරව මුදල් ලබාගෙන රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතනවල නිශ්කාර්යව පැවතීමෙන් ප්‍රතිසංස්කරණය සහ සංවර්ධනය උදෙසා වන ජාත්‍යන්තර බැංකුව සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමයෙන් ලබා ගන්නා ලද ණය සඳහා පොළී ගෙවීමට හේතුවේ. | 265.7 | 2017 සිට 2021 දක්වා | අදහස් දක්වා නොමැත. | මුදල් ලබා ගැනීමට පෙර නිසි අවශ්‍යතා විශ්ලේෂණයක් සිදුකළ යුතුය. |

**2.3 නීති,රීති සහ රෙගුලසි සමඟ අනුකූල නොවීම**

| | නීති,රීති සහ රෙගුලසිවලට යොමුව | අනුකූල නොවීම් | කළමනාකරණයේ අදහස් දැක්වීම් | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 507(2) සහ 2014 ඔක්තෝබර් 17 දිනැති අංක 02/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ඡේදයේ 3.1.7 සහ 3.2.7 වගන්ති | 2020 සහ 2021 වර්ෂ තුළදී රු.මිලියන 4.3 පිරිවැයකට මිළදී ගන්නා ලද භාණ්ඩ සහ උපකරණ වෙනුවෙන් ව්‍යාපෘතියේ මෙහෙයුම් තාක්ෂණික ලේකම් කාර්යාල වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | මෙහෙයුම් තාක්ෂණික ලේකම් කාර්යාල කිහිපයක් අනුගතවී නොතිබුණි. | මුදල් රෙගුලාසි සමඟ අනුකූල විය යුතුය. |
| (ආ) | අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | විද්‍යා, තාක්ෂණ, ඉංජිනේරු සහ ගණිත අංශ (STEM) යටතේ විශ්වවිද්‍යාල 15ක්, සිලිට් (SLIATE) සහ අධ්‍යාපන අමාත්‍යාංශය සඳහා මිලදී ගත් රු.මිලියන 2,332ක් වටිනා භාණ්ඩ සහ උපකරණ සහ අතිරේක මූල්‍යනය යටතේ රු.මිලියන 430ක පිරිවැයකට මිළදී ගන්නා ලද රසායනාගාර උපකරණ සහ ලී බඩු පිළිබඳ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | මෙම අවශ්‍යතාවය සම්පූර්ණ කරනු ලැබේ. | චක්‍රලේඛ උපදෙස් සමඟ අනුකූල විය යුතුය. |
| (ඇ) | වැඩසටහන් ඇගයීම් ලේඛණයහි වැඩසටහන් මෙහෙයුම් තාක්ෂණික සහාය සංරචකයෙහි 10 ඇමුණුම 7 ඡේදය සහ 2019 මාර්තු 05 දිනැති අංක 01/2019 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 2.1.2 ඡේදය | මෙහෙයුම් සහ අධීක්ෂණ සහය කණ්ඩායමේ ව්‍යාපෘති කාර්යාලයේ (OMST) අනුමත කළමනාකරණ සහකාර පුරප්පාඩු 7ක් පැවති අතර OMST ව්‍යාපෘති කාර්යාලයේ තාක්ෂණික සහායකයින් 20 දෙනෙකු අනුයුක්ත කර 2021 වර්ෂය තුළදී අනුමැතියකින් තොරව රු.මිලියන 13ක් ගෙවා තිබුණි. මෙම තාක්ෂණික සහායකයින් 20 දෙනාට අමතරව විශ්වවිද්‍යාලවල මෙහෙයුම් තාක්ෂණික ලේකම්කාර්යාලවල (OTS) වෙනත් තාක්ෂණික සහායකයින් 24 දෙනෙකු අනුයුක්ත කර රු.මිලියන 1.2ක් ගෙවා තිබුණි. | ණය ගිවිසුමේ කොටසක් වන ව්‍යාපෘති මෙහෙයුම් අත්පොතෙහි තාක්ෂණික සහායකින්ගේ පත්කිරීම් සඳහා ප්‍රතිපාදන පවතී. 2019 අප්‍රේල් 29 දින පවත්වන ලද මෙහෙයුම් කමිටු රැස්වීමේදීත් තාක්ෂණික සහායකයින්ගේ පත්වීම් අනුමත කර තිබුණි. | නිසි අනුමැතිය ලබාගත යුතුය. |

**3. භෞතික කාර්යසාධනය**

**3.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ භෞතික මූල්‍ය ප්‍රගතිය**

| සංරචකය උප සංරචකය | 2021 දෙසැම්බර් 31 දිනට | විගණන ගැටලුව | කළමනාකරණයේ අදහස් දැක්වීම් | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) පර්යේෂණ, නවෝත්පාදනය සහ වාණිජකරණය (RIC) | 2021 දෙසැම්බර් 31 දිනට සිලිට් (SLIIT) ආයතනය ප්‍රතිපාදිත මුදලින් සියයට 68ක් උපයෝජනය කර තිබුණි. | අපේක්ෂිත ප්‍රතිලාභ ලඟාකර ගැනීමට නොහැකි වේ. | පර්යේෂණ නවෝත්පාදනය සහ වාණිජකරණය 2022 නොවැම්බර් මාසයෙන් අවසන් වන වර්ෂ 3ක ව්‍යාපෘතියක් වේ. | ප්‍රගතිය වැඩිකිරීමට අවශ්‍ය වේ. |
| (ආ) සංවර්ධනය ඉලක්ක කරගත් පර්යේෂණ | මුළු ප්‍රතිපාදිත මුදලින් සිලිට් (SLIIT), සිනෙක් (CINEC), කේඩීයු (KDU) සහ සණස (SANASA) යන රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන 2021 දෙසැම්බර් 31 දිනට සියයට 49.6 සිට සියයට 53ක අතර මුදලක් උපයොජනය කර තිබුණි. | අපේක්ෂිත ප්‍රතිලාභ ලඟාකර ගැනීමට නොහැකි වේ. | කොවිඩ් 19වල බලපෑම සහ නිරන්තර වසාදැමීම් සැලකීමේදී කිහිප දෙනෙකු හැර සියළුම කණ්ඩායම්වල ප්‍රගතිය විශිෂ්ඨ වේ. | ප්‍රගතිය වැඩිකිරීමට අවශ්‍ය වේ. |
| (ඇ) සමාජ සම්බන්ධතා ඒකක සංවර්ධනය | මුළු ප්‍රතිපාදන මුදලින් සෙජිස් (SAEGIS) කේඩීයූ (KIU) සහ සණස (SANASA) යන රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන 2021 දෙසැම්බර් 31 දිනට සියයට 49.6 සිට සියයට 56.7ක් අතර මුදලක් උපයෝජනය කර තිබුණි. | අපේක්ෂිත ප්‍රතිලාභ ලඟාකර ගැනීමට නොහැකි වේ. | උසස් අධ්‍යාපන ආයතනවල සමාජ සම්බන්ධතා ඒකක සංවර්ධනය 2023 දී පමණ නිමකරනු ලැබේ. එමනිසා මෙහි දැක්වෙන ප්‍රගතිය 2021 දෙසැම්බර් අවසාන දිනට ප්‍රසංශනීය වේ. | ප්‍රගතිය වැඩිකිරීමට අවශ්‍ය වේ. |

**3.2** කටයුතුවල භෞතික ප්‍රගතිය

--------------------------------

ව්‍යාපාති සංරචකය -මෙහෙයුම් සහ අධීක්ෂණ සහාය කණ්ඩායම

| සංරචකය<br>උප සංරචකය | 2021 දෙසැම්බර් 31 දිනට<br>අපේක්ෂිත භෞතික කාර්යසාධනය සහ ලඟාකරගත් කාර්යසාධනය | ප්‍රමාදය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) සිලිට් (SLIIT) ආයතනයේ පර්යේෂණ නවෝත්පාදනය සහ වාණිජකරණය කටයුතු | රු.මිලියන 12.5 මුදලින්, මානව ශාස්ත්‍ර හා විද්‍යා පීඨය ජාන වෙනස් කිරීම හරහා අපනයනය සඳහා අඩු වියදම් ක්ෂුද්‍ර ජීවීන් ප්‍රචාරණ ක්‍රම මගින් වාණිජකරණය කළ හැකි පර්යේෂණ සිදුකිරීම කිරීම සහ වැඩිදියුණු කරන ලද විසිතුරු පැළ නිෂ්පාදනය කිරීම සඳහා රුපියල් මිලියන 8.5 ක මුදලක් භාවිතා කර ඇත. ගිවිසුමට අනුව ක්‍රියාත්මක දිනය 2019 අප්‍රේල් අනුමත යොජනා ක්‍රියාත්මක දිනය 2019 ජුනි අපේක්ෂිත අරමුණු ලඟාකර ගැනීමට නියමිත දිනය 2022 ඔක්තෝබර් වේ. | සිලිට් (SLIIT) ආයතනය විසින් ලබාදෙනු ලද තොරතුරු අනුව කොවිඩ් වසංගතය හේතුවෙන් සුළු ප්‍රමාදයන් සිදුවී ඇත. | අවශ්‍ය උපකරණ හා රසායනික ද්‍රව්‍ය ලබා ගැනීමට බලපාන ලද මිල විචලායන් සහ ආනයන සීමා තිබියදීත් 2021 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය හොඳ මට්ටමක පවතී. | ප්‍රගතිය වැඩිකර ගැනීමට අවශ්‍ය අතර ඉලක්ක ලගාකර ගත යුතුවේ. |
| (ආ) සිලිට් (SLIIT) ආයතනයේ සංවර්ධනය ඉලක්ක කරගත් පර්යේෂණ | රු.මිලියන 10න්, මානව ශාස්ත්‍ර හා විද්‍යා පීඨය ශ්‍රී ලංකාවේ තරුණ ජනගහනය අතර අන්තර්ජාලය හරහා සිදුවන හිරිහැර පිළිබඳ විමර්ශනයක්, සිදුකිරීම හා අන්තර්ජාලය හරහා සිදුවන හිරිහැරවලට එරෙහිව සටන් කිරීම සඳහා ජාතික උපාය මාර්ගයක් සංවර්ධනය කිරීම සඳහා එකතුව රු.මිලියන 3.1ක් උපයෝජනය කර තිබුණි. | සිලිට් (SLIIT) ආයතනය විසින් ලබා දෙන ලද තොරතුරු අනුව කොවිඩ් වසංගතය හේතුවෙන් ප්‍රමාදයන් සිදුවී ඇත. | කොවිඩ් 19 වසංගතය හා වසාදැමීම් හේතුවෙන් දත්ත එකතු කිරීම ප්‍රමාද විය. | ප්‍රගතිය වැඩිකර ගැනීමට අවශ්‍ය අතර ඉලක්ක ලගාකර ගත යුතුවේ. ව්‍යාපෘතිය විසින් කරන කටයුතු පිළිබඳව සමීප අධීක්ෂණයක් සිදුකළ යුතුය. |
| (ඇ) සෙජීස් (SAEGIS) | රු.මිලියන 8න්, කළමනාකරණ පීඨය විසින් ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික සංවර්ධන සඳහා වැදගත් පියවරක් ලෙස ශ්‍රී ලංකාවේ | සෙජීස් (SAEGIS) ආයතනය විසින් ලබා දෙන ලද තොරතුරු අනුව කොවිඩ් වසංගතය | මෙම කණ්ඩායම කාර්යසාධන දර්ශක ලඟා කරගෙන ඇති නිසා ව්‍යාපෘතිය ඉක්මනින් අවසන් | ප්‍රගතිය වැඩිකර ගැනීමට අවශ්‍ය අතර ඉලක්ක ලගාකර ගත යුතුවේ. ව්‍යාපෘතිය විසින් |

| | | |
|---|---|---|
| පාසල්වල ඉංග්‍රීසි භාෂා ප්‍රමිතින් වැඩිදියුණු කිරීම කෙරෙහි සමාජ ආර්ථික සාධකවල බලපෑම් ඇගයීම සඳහා එකතුව රු.මිලියන 7.6ක් භාවිත කර තිබුණි. | හේතුවෙන් කරනු ලැබේ. ප්‍රමාදයක් සිදුවී ඇත. | කරන කටයුතු පිළිබඳව සමීප අධීක්ෂණයක් සිදුකළ යුතුය. |

## 3.3 අනාර්ථික ගණුදෙනු

| විගණන ගැටලුව | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| මූලය ප්‍රකාශන අනුව මෙහෙයුම් සහ අධීක්ෂණ සහය කණ්ඩායම් ව්‍යාපෘති කාර්යාලය (OMST) ගොඩනැගිලි පරිශ්‍රය සඳහා 2021 වර්ෂය තුළදී එකතුව රු.මිලියන 22.6ක් වැයකර තිබුණි. කෙසේවෙතත්, මෙහෙයුම් සහ අධීක්ෂණ සහය කණ්ඩායමේ කාර්ය මණ්ඩලය 35ක් පමණක් සේවයේ යොදවා තිබුණි. තවද, වාහන කුලිය සඳහා එකතුව රු.මිලියන 4.5ක් සහ ප්‍රවාහන වියදම් සඳහා රු.මිලියන 3.5ක් වැයකර තිබුණි. | කාර්යාල පරිශ්‍රය සහ අනෙකුත් සේවා තරඟකාරී ප්‍රසම්පාදන ක්‍රමවේදයක් මගින් තෝරාගෙන ඇති අතර වඩාත් ආර්ථිකමය වාසි මිල ගණන් සලකා ඇත. | වියදම් ආර්ථිකමය වාසි ආකාරයට දැරිය යුතුය. |

## 3.4 මානව සම්පත් කළමනාකරණයට අදාල ගැටලු

| විගණන ගැටලුව | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|
| ව්‍යාපෘතියේ මෙහෙයුම් සහ අධීක්ෂණ සහය කණ්ඩායමේ කාර්ය මණ්ඩලයේ විවිධ තනතුරුවල පුරප්පාඩු 21ක් සහ අතිරික්ත සේවකයින් 15ක් විය. පුරප්පාඩු තනතුරු 4ක කාර්ය මණ්ඩලය ව්‍යාපෘතියේ කාර්යසාධනයට සෘජුවම බලපානු ලැබේ. | අනුමත කාර්යමණ්ඩල තනතුරුවලට තාක්ෂණික සහායකින් බඳවාගෙන ඇත. මෙහෙයුම් සහ අධීක්ෂණ සහය කණ්ඩායමෙහි අතිරික්ත කාර්ය මණ්ඩලයක් නොමැත. ඉතිරි ව්‍යාපෘති කාලය වර්ෂයක් වේ. උසස් අධ්‍යාපනය පුළුල් කිරීම සහ සංවර්ධනය කිරීම වේගවත් කිරීමේ ව්‍යාපෘතියට දැනට සිටින කාර්ය මණ්ඩලයෙන් කළමනාකරණය කර ගැනීමට හැකිවේ. | කිසියම් බඳවාගැනීමක් සිදු කිරීමට පෙර කාර්ය මණ්ඩලය සංශෝධනය කිරීමට රජයේ ආයතනවලින් අවශ්‍ය අනුමැතිය ලබාගත යුතුය. ව්‍යාපෘතියේ සුමට ක්‍රියාකාරීත්වයට සහ අභ්‍යන්තර පාලන පද්ධතිය සහතිකවීමට ප්‍රධාන තනතුරු පිරවීමට පියවර ගතයුතුය. |

**3.5 පද්ධති හා පාලනයන්**

| විගණන ගැටලුව | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
| --- | --- | --- |
| විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ වැඩබලන අධ්‍යක්ෂ ජනරාල් විසින් 2021 ඔක්තෝබර් 28 දින ලෝක බැංකුව වෙත අමතර සිසුන් 10,027ක් බඳවා ගැනීමට පහසුකම් සැපයීමට යටිතල පහසුකම් සහ අනෙකුත් අවශ්‍යතාවලට මූල්‍යකරණය කිරීමට ව්‍යාපෘතිය යෝජනාවක් ඉදිරිපත් කර ඇත. දැනට සිදුකරන ඉදිකිරීම් කටයුතු නිම කිරීමට සහ පුනරුත්ථාපන කටයුතු අඛණ්ඩව සිදු කිරීමට, හදිසි අවශ්‍යතා සහිත උපකරණ මිලදී ගැනීමට සහ ප්‍රමුඛතා පදනමට අතැති බිල්පත් නිරවුල් කිරීමට අතිරේක මූල්‍යනයෙන් ආවරණය කර ගැනීමට මුදල් අමාත්‍යාංශ ලේකම්ගේ උපදෙස් අනුව ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව යෝජනා කරන ලදි. කෙසේවෙතත්, 2022 මැයි 09 දින වනවිටත් උසස් අධ්‍යාපනය පුළුල් කිරීම සහ සංවර්ධනය කිරීම වේගවත් කිරීමේ ව්‍යාපෘතිය සඳහා දෙනු ලබන රු.මිලියන 2,200ක අමතර මූල්‍යනය වෙනුවෙන් නව ගිවිසුමක් හෝ පවතින ගිවිසුම සංශෝධනයට පියවර ගෙන නොතිබුණි. | පවතින ගිවිසුම සංශෝධනය කිරීම සිදුකරමින් පවතින අතර ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි ණය ප්‍රතිව්‍යුහගතකරණය හේතුවෙන් ප්‍රමාදයක් සිදුවී ඇත. | නව ගිවිසුමකට එළඹීමට හෝ මුල් ගිවිසුම සංශෝධනය කිරීමට පියවර ගත යුතුය. |